

**නිවස සරසන විසිතුරු පැළ**



# ගතට සිසිල දෙන
# මීවන



නිවසේ හා ගෙවත්තේ වැඩෙන විසිතුරු පැළ ගොත්තේ සිසිල් සාමාජිකයා ලෙස මීවන හැඳින්විය හැකිය. මීවන අයත් වන්නේ මල් හට නොගන්නා හෙවත් අපුෂ්ප ශාක වංශයටය. ඇල්ගේ, පාසි, සැලජිනෙල්ලා සහ ලයිකොපෝඩියම් හා බෙදුරු ද මීවන අයත් කණ්ඩායමට අයත් වේ. මේවායේ පත්‍රවල යට පැත්තේ ඇති බීජානු ශෘහවල සෑදෙන බීජානු මේරූ පසු වාතයට එක්වී ව්‍යාප්ත වන අතර අවශ්‍ය තෙතමනය හා සෙවන ඇති තැන්වල පතිත වූ විට පැළ වේ.

ලෝකය පුරා මීවන විශේෂ 9000 ක් පමණ ඇති අතර වැඩි වශයෙන් සමකයට ආසන්න ප්‍රදේශවල දක්නට ලැබේ. ඉතා සිහින් කෙස් ගසක ප්‍රමාණයේ සිට අඩි 80 ක් තරම් උසට වැඩෙන විශාල ප්‍රමාණයේ ශාක දක්වා පරාසයක මීවන කාණ්ඩය විහිදේ. ඇතැම් මීවන වර්ග අපිශාක (වෙනත් ශාක මත වැඩෙන එම ශාකයෙන් පෝෂණය නොවන) ලෙසද පවතී. මේවා භූගත කඳන්වලින් යුක්ත වේ. බොහෝ වර්ගවලට ඇත්තේ පොළොවට ඍජුව වැඩෙන අලවිය නමින් හැඳින්වෙන භූගත කඳකි. ඒවායේ කඳෙන් මතුවන පත්‍ර සමූහය කූඩයක ආකාරයට විසිර පවතී. තවත් වර්ගවල පොළොවට සමාන්තරව විහිදෙන භූගත කඳෙහි තැනින් තැනින් පත්‍ර මතු වේ. ගස් වශයෙන් වැඩෙන මීවනවල ස්ත්‍රී හා පුරුෂ ශාක වෙන වෙනම පිහිටයි.

ප්‍රචාරණය - මේවා බෝකර ගත හැකි ක්‍රම තුනක් ඇත.

1. පඳුරුවල පැළ වෙන් කිරීමෙන්
2. පත්‍ර මත හටගන්නා කුඩා ශාක වෙන්කිරීමෙන්
3. පත්‍ර යටිපැත්තේ හටගන්නා බීජානුවලින්

මුල් ක්‍රම දෙක වෙනත් පැලවලදී යොදා ගන්නා ආකාරයටම ක්‍රියාත්මක කළ හැකිය. බීජානු මගින් බෝකර ගැනීම එකවර පැළ රාශියක් ලබා ගැනීමට යෝග්‍ය එහෙත් තරමක් අසීරු ක්‍රියාමාර්ගයකි. මෙහිදී ප්‍රධානතම ප්‍රශ්නය වන්නේ බීජානුවල වර්ධනයට අවශ්‍ය ආලෝක තත්ත්වය (එළිය හෝ අඳුර) ද ජලය ද ප්‍රශස්ත මට්ටමින් ලබාදීමත් දිලීර වර්ධනය මගින් වන හානිය වළකා ගැනීමත්ය. කුඩුකරගත් ගඩොල් මත පත්‍රවලින් සූරාගත් බීජානු තුනීව වපුරා මැටි බඳුන වීදුරු තහඩුවකින් වසා තැබිය යුතුය. බීජානු පැළවීම සඳහා මඳ අඳුරක් අවශ්‍ය බැවින් වීදුරුව මත තද පැහැති කඩදාසියක් අතුරා තැබීම සුදුසුය.

මැටි බඳුන වෙනත් නොගැඹුරු බඳුනක් තුළ තබා පිටත බඳුනට ජලය දමා තැබීමෙන් මිශ්‍රණයට අවශ්‍ය තෙතමනය ලබා දිය හැකිය. බඳුන විවෘත කිරීම නොකළ යුතු අතර වරින් වර කඩදාසිය මඳක් ඉවත්කර බීජානු පැළ වී තිබේදැයි බැලිය හැකිය. පැලවීම සාර්ථක නම් ගඩොල්කුඩු මතු පිට කොළපැහැති පත්‍ර වැනි ව්‍යූහ දැකිය හැකි වේ. ඉන්පසු තද පැහැති කඩදාසිය ඉවත් කර පත්තර කඩදාසි පිටු දෙකකින් එය වසා තබා තවත් දින කීපයක් ගතවන විට ඉන් එක් පිටුවක් ඉවත් කළ යුතුය. මේ ආකාරයට මීවන පැලවීමේදී ආලෝක ප්‍රමාණය ක්‍රමයෙන් වැඩි කළ යුතු වේ. මීවන පැළ මතුවන තෙක් උඩින් ජලය දැමීම නොකළ යුතුය. දින 7 සිට සති 4 දක්වා කාලයකදී පැළ මතුවනු ඇත.

මීවන පැලවලට ජලය යෙදීමේදී එහි බඳුනේ පසෙහි මතුපිට යන්තම් වියළී තත්ත්වයට පත්වී ඇත්දැයි පරීක්ෂා කරන්න. එසේ වියළී ඇත්නම් පමණක් ජලය යෙදීම කළ යුතු වේ.

බොහෝ මීවන වර්ග සඳහා තෙත් සිසිල් වාතය රැඳි පරිසරයක් අවශ්‍ය වේ. මුල් සඳහා ජලය හෙමින් වහනය වන වරින්වර වියළී තත්ත්වයට පත්වන පසක් අවශ්‍ය වේ.

හොඳින් වවා ගත් මීවන පැළ ගොත්තක් වෙත යන ඔබ ගතට මෙන්ම සිතටද දැනෙන සිසිල් සුවය දිවියේ කරදර මොහොතකට හෝ අමතක කර දැමීමට සමත්වන බව සඳහන් කළ යුතුය. ❑

**තිලක් ගමගේ**

